ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1987 අංක 49 දරන
# නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 දෙසැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 දෙසැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1987 අංක 49 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 දෙසැම්බර් මස 24 වන දින]

එල්.ඩී.—ඕ. 6/87

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1987 අංක 49 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1982 අංක 4 දරන පනතින් සංශෝධිත පරිදි වූ, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8ඔ වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8ඕ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන පනතෙහි අලුත් 8ඕ වගන්තිය ඇතුළත් කිරීම.

" වරිපනම් බදු අඩු කිරීම.

8ඕ. (1) 8ඒ වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ හා ඊට අනුකූලව යම් සංවර්ධන ප්‍රදේශයක යම් ගොඩනැගිල්ලක් ඉදි කර ඇති අවස්ථාවක, මහ නගර සභා ආඥා පනතේ හා නගර සභා ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද

(අ) එම ඉදිකිරීම සම්බන්ධයෙන් 8ඔ වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයේ දිනයේ සිට ගණන් ගත යුතු අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා ඒ යම් ආඥාපනතක් යටතේ එම ගොඩනැගිල්ල සඳහා තක්සේරු කරන ලද වරිපනම් බද්දෙන් සියයට අසූවක අඩු කිරීමකට අවස්ථාවෝචිත පරිදි, මහ නගර සභාව හෝ නගර සභාව විසින් ඉඩ දිය යුතු ය ; තවද

(ආ) (අ) ඡේදයේ සඳහන් කාල පරිච්ඡේදය ඉකුත්වීමේ සිට ගණන් ගත යුතු අවුරුදු පහක වැඩි දුර කාල පරිච්ඡේදයක් සඳහා එම වරිපනම් බදුවල සියයට පණහක අඩුකිරීමකට අවස්ථාවෝචිත පරිදි, මහ නගර සභාව හෝ නගර සභාව විසින් ඉඩ දිය යුතු ය.

(2) 8ඒ වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ හා ඊට අනුකූලව යම් සංවර්ධන ප්‍රදේශයක යම් ගොඩනැගිල්ලක් ප්‍රති සංවර්ධනය කර ඇති විටෙක, මහ නගර සභා ආඥාපනතේ හා නගර සභා ආඥාපනතේ සුමක් සඳහන්ව ඇත ද එම ප්‍රතිසංවර්ධනය පිළිබඳව 8ඕ වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයේ දිනයේ සිට ගණන් ගත යුතු අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා එසේ ප්‍රතිසංවර්ධනය කරන ලද ගොඩනැගිල්ල සඳහා තක්සේරු කරන ලද වරිපනම් බද්දෙන් සියයට පණහක අඩුකිරීමකට අවස්ථාවෝචිත පරිදි, මහ නගර සභාව හෝ නගර සභාව විසින් ඉඩ දිය යුතු ය.".

2 වන වගන්තිය අතීතයටත් බලපෑම.

3. මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, 1979 නොවැම්බර් මස 12 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.